SRI LANKA

## ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# 2015 ජූලි විභාගය - AA1 මට්ටම

# යෝජිත උත්තර
# (AA14)

## ව්‍යාපාර නීතිය සහ ආචාරධර්ම
## (BLE)


ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය
නො. 540, පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි මාවත,
නාරාහේන්පිට, කොළඹ 05.

දුරකථන : 011-2-559 669

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශය

# 2015 ජූලි විභාගය - AA1 මට්ටම

## (14) ව්‍යාපාර නීතිය සහ ආචාරධර්ම

## යෝජිත උත්තර

**A කොටස**

සියලුම ප්‍රශ්නවලට උත්තර අපේක්ෂිතය.

### 1 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

| | |
|---|---|
| 1.1 | (2) |
| 1.2 | (3) |
| 1.3 | (3) |
| 1.4 | (1) |
| 1.5 | (1) |
| 1.6 | (2) |
| 1.7 | (1) |
| 1.8 | (3) |
| 1.9 | (1) සහ (3) |
| 1.10 | (1) |
| 1.11 | (2) |
| 1.12 | අසත්‍යය. |
| 1.13 | සත්‍යය. |
| 1.14 | අසත්‍යය. |
| 1.15 | 1. ලේඛනයේ අයිතිය පහසුවෙන් පැවරිය හැකි වීම.<br>2. ධාරකට තම නමින් නඩු පැවරිය හැකි වීම. |
| 1.16 | පහත ඒවායින් දෙකක්,<br>1. අවංක බව 2. රහස්‍ය බව සුරැකීම<br>3. නිසි අවධානය 4. ස්වාධීනත්වය |
| 1.17 | පාරිතෝෂිකය = අවසාන මාසික වැටුප = 1/2 x සේවායෝජක වෙත සම්පූර්ණ කර ඇති වර්ෂ ගණන |
| 1.18 | පහත ඒවායින් තුනක්,<br>1. සමතකරණය 2. බේරුම්කරණය<br>3. සාමූහික ගිවිසුම් 4. කම්කරු විනිශ්චය සභා |

***A* කොටසෙහි අවසානය.**

## B කොටස

සියලුම ප්‍රශ්නවලට උත්තර අපේක්ෂිතය.

### 2 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

පහත කරුණු අතුරෙන් හතරක් (04),

(1) නියෝජිතයා තුන්වන පාර්ශ්වය සමග ගිවිසුමට ඇතුළත් වන මොහොතේ දී ප්‍රධානියාට පැවැත්මක් තිබිය යුතුය.

(2) නියෝජිත විසින් තම ප්‍රධානියා ගැන තුන්වන පාර්ශ්වයට නම ද සහිතව හෙළිදරව් කර තිබිය යුතුය.

එනම් තමා නියෝජිතයෙකු බවත්, තම ප්‍රධානියාගේ නම කුමක් ද යන්නත් තුන්වන පාර්ශ්වය වෙත හෙළි කර තිබිය යුතුය.

(3) ගිවිසුම ගැන ප්‍රධානියාට සියලුම වැදගත් දෑ හෙළි කළ යුතුය.

(4) නියෝජිත ගිවිසුමට ඇතුළු වූයේ යම් ප්‍රධානියෙකු වෙනුවෙන් ද, එම ප්‍රධානියා විසින් ම එම ගිවිසුම පසුව කොටස් වශයෙන් නොව මුළුමනින් ම අනුමත කර තිබිය යුතුය.

(5) සාධාරණ කාලයක් තුළ අනුමත කළ යුතුය.

(6) හිස් ගිවිසුමක් අනුමත කළ නොහැකිය.

### 3 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

(a) පහත ඒවා අතුරෙන් තුනක් (03),

1. **වගකීම සීමාසහිත වීම**

එනම් සමාගමේ වගකීම සම්බන්ධයෙන් කොටස් හිමියන්ගේ වගකීම කොටස්වල අගය දක්වා (කොටසින් සීමිත සමාගමක) පමණක් හෝ කලින් එකඟ වී ඇති අගයක් දක්වා (ඇපයෙන් සීමිත සමාගමක) පමණක් සීමා වේ. නමුත් තනි පුද්ගල හෝ හවුල් ව්‍යාපාරයක වගකීම් සඳහා ඒවායේ අයිතිකරු / හවුල්කරු අසීමිත ලෙස පුද්ගලිකව වගකීමට බැඳේ.

2. **විශාල ප්‍රාග්ධනයක් රැස්කර ගත හැකි වීම**

තනි පුද්ගල හෝ හවුල් ව්‍යාපාරයක මෙන් නොව පොදු සමාගමකට මහජනයා වෙත කොටස් නිකුත් කළ හැකි බැවින් විශාල ප්‍රාග්ධනයක් රැස්කර ගැනීමට හැකියාව ඇත.

3. **නෛතික පුද්ගලභාවය**

සමාගමක් ලියාපදිංචියෙන් පසු එය වෙනම පුද්ගලයෙකු ලෙස නීතිය පිළිගනී. එමනිසා එම සමාගමේ නමින් නඩු පැවරීම සහ පවරනු ලැබීමටත්, එහි නමින් ගිවිසුම්වලට එළඹීමටත්, දේපළ අත්පත් කරගැනීමටත් හැකියාව ඇත.

4. **අඛණ්ඩ පැවැත්ම**

සමාගමක අයිතිකරු සහ/හෝ අධ්‍යක්ෂවරු වෙනස් වුව ද, මිය ගිය ද එය සමාගමේ පැවැත්ම කෙරෙහි බලනොපායි.

(b) සාංගමික ව්‍යවස්ථාවලියේ අන්තර්ගතයන් :- පහත ඒවා අතුරෙන් ඕනෑම දෙකක් (02),

1. සමාගමේ පරමාර්ථ
2. කොටස් හිමියන්ගේ අයිතිවාසිකම් සහ යුතුකම්
3. සමාගම කළමනාකරණය සහ පරිපාලනයට අදාළ විධිවිධාන

## 4 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

**යථා කාලයේ දරන්නෙකු වීමට සපුරාලිය යුතු අවශ්‍යතා :**

(1) බිල් පත්‍රය මතුපිටින් සම්පූර්ණ සහ විධිමත් විය යුතුය.

උදා :- අදාළ බිල් පත්‍රය අණකරු විසින් අත්සන් කර නොමැති නම්, බලය නොමැති සංශෝධන සිදු කර ඇති විට එය මතුපිටින් පෙනෙන පරිදි අසම්පූර්ණ සහ අවිධිමත් වේ.

(2) ධාරක විසින් බිල කල් ඉකුත් වීමට පෙර ලබාගෙන තිබිය යුතුය.

එනම් කාලීන බිලක් නම් අදාළ නිශ්චිත හෝ නියත අනාගත සිද්ධිය සිදුවීමෙන් පසුව කල් ඉකුත් වේ. ඉල්ලු විට ගෙවිය යුතු බිලක් නම් සාධාරණ කාලයක් ඉකුත් වීමෙන් පසුව කල් ඉකුත් වේ. එමනිසා එවැනි බිලක් ලබාගත් අයට යතාකාල ධාරක විය නොහැක.

(3) බිල කලින් අගරු වී ඇතත් ධාරක ඒ බව නොදැන බිල ලබාගෙන තිබිය යුතුය. එනම් ප්‍රතිග්‍රහණය නොකිරීම මත හෝ මුදල් නොගෙවීම මත බිල අගරු වී ඇතත් ඒ බව නොදැන ධාරක විසින් බිල පවරාගෙන තිබිය යුතුය.

(4) ධාරක විසින් බිල් පත්‍රය අගනා ප්‍රතිෂ්ඨාවක් සඳහා ලබාගෙන තිබිය යුතුය.

යතාකාල ධාරකයෙකු වීම සඳහා එම ධාරක විසින් ම ප්‍රතිෂ්ඨාව ගෙවා තිබිය යුතුය. වෙනත් පාර්ශ්වයක් ගෙවූ ප්‍රතිෂ්ඨාවක් මත යතාකාල ධාරකයෙකු විය නොහැක.

(5) ධාරකයා සද්භාවයෙන් යුතුව බිල්පත ලබාගෙන තිබිය යුතුය.

බිල්පතෙහි ධාරකයාට, එය සොරකම් කරන ලද්දක් බවට වන කරුණු පිළිබඳව අවබෝධයක් තිබේ නම්, එවැනි ධාරකයෙකු 'යථාකාලීන ධාරකයෙකු' බවට පත් නොවේ.

(6) ධාරකයා හට බිල්පත ප්‍රතිපාදන කරන අවස්ථාවේ දී, ඔහුට එය ප්‍රතිදානය කළ පුද්ගලයාගේ හිමිකමෙහි තිබූ දෝෂ පිළිබඳව කිසිදු දැනීමක් නොතිබිය යුතුය.

## 5 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

(a) X කාන්තාවක් නම් වයස අවුරුදු 50 එළඹ රැකියාවෙන් විශ්‍රාම යයි නම් පමණක් මුදල් ලබාගත හැක. මෙම වයස් සීමාවෙන් පසුවත් එම සේවිකාව දිගටම රැකියාවේ නිරත වෙයි නම් රැකියාවෙන් ඉවත් වන තුරු මුදල් ලබාගත නොහැක.

(b) X ට සේවක අර්ථසාධක අරමුදලෙන් මුදල් ආපසු ලබාගත නොහැක. X කාන්තාවක වුව ද, පුරුෂයෙකු වුව ද සේවක අර්ථසාධක අරමුදලෙන් මුදල් ආපසු ලබාගත හැක්කේ ඔහු හෝ ඇය නැවත පැමිණීමේ බලාපොරොත්තුවක් රහිතව ලංකාවෙන් පිටත්ව යන්නේ නම් පමණි.

(c) X කාන්තාවක වුව ද, පුරුෂයෙකු වුව ද රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත පත්වීමක් බාරගැනීමේ දී සේවක අර්ථසාධක අරමුදලෙන් දායක මුදල් ආපසු ලබාගැනීමට හිමිකමක් ඇත.

(d) විවාහවීම හේතුවෙන් සේවයෙන් අස්වීමේ දී X කාන්තාවක් නම් පමණක් සේවක අර්ථසාධක අරමුදලෙන් දායක මුදල් ආපසු ලබාගත හැක. නමුත් X පුරුෂයෙකු නම් විවාහවීම හේතුවෙන් ඔහුට මුදල් ලබාගත නොහැක.

***B* කොටසෙහි අවසානය.**

## C කොටස

අනිවාර්ය ප්‍රශ්න දෙකටම (02) උත්තර අපේක්ෂිතය.

(මුළු ලකුණු 28)

## 6 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

**(a)**

(1) වලංගු අර්පණයක් පැවතිය යුතුය.

අර්පණයක් යනු ගිවිසුමකට ඇතුළුවීමේ අරමුණින් එක් පාර්ශ්වයක් විසින් තවත් පාර්ශ්වයක් වෙත කරනු ලබන නිශ්චිත යෝජනාවකි.

(2) වලංගු ප්‍රතිග්‍රහණයක් පැවතිය යුතුය.

අර්පණදායී විසින් කරනු ලබන යෝජනාව අර්පණලාභී විසින් කොන්දේසි විරහිතව ඒ ආකාරයෙන් ම පිළිගැනීම කර තිබිය යුතුය.

(3) සාධාරණ හේතුවක් පැවතිය යුතුය.

එනම් වලංගු ගිවිසුමක් සඳහා අගනා ප්‍රතිෂ්ඨාවක් හෝ සදාචාරාත්මක බැඳීමක් පැවතිය යුතුය.

(4) පාර්ශ්වකරුවන් අතර නෛතික සම්බන්ධතා ඇති කරගැනීමේ බරපතළ චේතනාවක් පැවතිය යුතුය.

එනම් පාර්ශ්වකරුවන් ගිවිසුමට ඇතුළු වන මොහොතේ දී එම ගිවිසුම මගින් නෛතික සම්බන්ධතා ඇති කරගැනීමට පාර්ශ්වකරුවන් අතර චේතනාවක් පැවතිය යුතු බවයි. මේ අනුව යම් පාර්ශ්වයක් ගිවිසුම යටතේ ඉටු කළ යුතු යුතුකම් පැහැර හරී නම් එම පාර්ශ්වයට එරෙහිව නීතියේ සහන පැතීමට පාර්ශ්වකරුවන් අතර චේතනාවක් පැවතිය යුතුය.

(b) මෙහි චාමර යනු බාලවයස්කරුවෙකි. බාලවයස්කරුවන් ඇතුළත් වන ගිවිසුම් සලකනු ලබන්නේ හිස් කළ හැකි (Voidable Contracts) ගිවිසුම් ලෙසටය.

එනම් වලංගු ගිවිසුමකට ඇතුළත් වීමෙන් පසුව ද බාලවයස්කරුට තම අභිමතය පරිදි එම ගිවිසුමෙන් ඉවත් වීමට හැකියාව ඇත.

නමුත් බාලවයස්කරුවෙක් ඇතුළත් වන ගිවිසුම් හිස් කළ හැකි ගිවිසුම්ය යන රීතියට ව්‍යතිරේඛ අවස්ථාවන් ද ඇත.

මෙම ව්‍යතිරේඛ අවස්ථාවල දී බාලවයස්කරු ද වෙනත් පුද්ගලයින් මෙන් එම ගිවිසුමෙන් වගකීමට බැඳේ.

උදා - බාලවයස්කරුට අත්‍යවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීමට ඇතුළු වන ගිවිසුම්වලින් බාලවයස්කරු වගකීමට බැඳේ. එසේම බාලවයස්කරුගේ අධ්‍යාපනය, පුහුණුවීමේ හෝ ආධුනිකත්ව ගිවිසුම්වලින් බාලවයස්කරු වගකීමට බැඳේ.

*නීතිපති එදිරිව කොස්තා*

මෙහි චාමර විසින් ඇතුළත්ව ඇත්තේ පුහුණුවීමේ ගිවිසුමකටය. එබැවින් එය ඉහත කී ව්‍යතිරේඛ අවස්ථාවන්ට ඇතුළත් වන අවස්ථාවක් වන බැවින් එම ගිවිසුමෙන් චාමර වගකීමට බැඳේ. මේ අනුව චාමර ගිවිසුම අවසන් කළ විටෙක දී ඔහුට එරෙහිව අලාභ අය කරගැනීම සඳහා ගිවිසුමේ අනෙක් පාර්ශ්වයට නඩු පැවරිය හැක.

## 7 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

**(a)**

(1) අදාළ භාණ්ඩ විකුණා ඇත්තේ යම් ව්‍යවස්ථාවක් මත ලැබී ඇති බලයක් හෝ අධිකරණ නියෝගයක් මත නම්,

උදා - උකස් පනත යටතේ කරනු ලබන විකිණීමක්

(2) ප්‍රතිබන්ධන රීතිය යෙදීමෙන්

ප්‍රතිබන්ධනය යනු යම් පුද්ගලයෙකුගේ හැසිරීම මත තවත් පුද්ගලයෙකුගේ සිතෙහි විශ්වාසයක් ඇති කර ඇත්නම් එම විශ්වාස කළ කරුණු අසත්‍යයක් බව පසුව පැවසීම, විශ්වාසය ඇති කළ පාර්ශ්වයට නීතියෙන් ඉඩ නොලැබීමයි.

(3) භාණ්ඩ විකුණා ඇත්තේ වෙළෙඳ නියෝජිතයෙක් විසින් නම්,

වෙළෙඳ නියෝජිතට තමා විකුණන භාණ්ඩවල භුක්තිය හිමිවන නිසා දෘශ්‍ය බලයක් හිමි වේ. එමනිසා ප්‍රධානියා විසින් දැනුම් දී ඇති මිලට වඩා අඩු මිලට භාණ්ඩ විකුණා තිබුණ ද ගැනුම්කරුට හොඳ හිමිකමක් හිමි වේ.

(4) භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් යටතේ විකුණා ඇති භාණ්ඩවල අයිතිය ගැනුම්කරුට පැවරී ඇතත්, ඒවායේ භුක්තිය තවදුරටත් විකුණුම්කරු සතුවන විටදී විකුණුම්කරු එම භාණ්ඩ තමාගේ සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවල දී වෙනත් පාර්ශ්වයකට විකුණයි නම් එම වෙනත් පාර්ශ්වයට භාණ්ඩ සම්බන්ධයෙන් හොඳ හිමිකමක් ලැබේ.

**(b)**

ශෙහාන් විසින් ඇතුළත්ව ඇත්තේ භාණ්ඩ මිලදී ගැනීමේ ගිවිසුමකටය. මෙවැනි ගිවිසුමක ඇතුළත් වටහාගත යුතු කොන්දේසි දෙකක් වන්නේ,

(අ) භාණ්ඩ වාණිජ්‍යමය යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු බවයි.

වාණිජමය යෝග්‍යතාවය යනු යම් භාණ්ඩයක් සාමාන්‍යයෙන් යොදාගන්නා අවශ්‍යතාවයට සුදුසු විය යුතු බවත්, එහි සාධාරණ පරීක්ෂාවකින් හඳුනාගත නොහැකි දෝෂ නොතිබිය යුතු බවත් ය.

මේ අනුව සමිසයේ අඩංගු රසායන ද්‍රව්‍ය හේතුවෙන් සමේ ආසාදනයක් ඇති වීමෙන් පෙනී යන්නේ භාණ්ඩවල සාධාරණ පරීක්ෂාවකින් හඳුනාගත නොහැකි දෝෂ ඇතුළත්ව ඇති බවයි.

(ආ) භාණ්ඩ ගැනුම්කරුගේ අවශ්‍යතාවයට සුදුසු විය යුතු බවත් ය.

ඒ අනුව යම් භාණ්ඩයක් ගැනුම්කරුට අවශ්‍ය වී ඇත්තේ කුමන කාර්යයක් සඳහා ද යන්න ගැනුම්කරු විසින් විකුණුම්කරුට දැනුම් දී ඇති විට විකුණුම්කරු විසින් එම ගිවිසුම යටතේ සපයන භාණ්ඩ ගැනුම්කරුගේ එම අවශ්‍යතාවයට සුදුසු විය යුතු බවයි.

එමනිසා කමිසය මිලදී ගැනීමෙන් එය ඇඳීම සඳහා අවශ්‍ය බව ව්‍යංගව විකුණුම්කරුට දැනුම් දුන්නා ලෙස සැලකිය හැකි බැවින් විකුණුම්කරු විසින් සපයා ඇති භාණ්ඩ ගැනුම්කරුගේ එම අවශ්‍යතාවය සඳහා සුදුසු නොවේ.

මේ අනුව ඉහත කී වටහාගත හැකි කොන්දේසි දෙකම කඩ වී ඇති බැවින් ශෙහාන්ට සිදුව ඇති අලාභ විකුණුම්කරුගෙන් ඉල්ලා සිටිය හැකිය.

**C කොටසෙහි අවසානය.**